**වැල්ලවාය ප්‍රාදේශීය සභාව**
**මොණරාගල දිස්ත්‍රික්කය**
-------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 13 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 28 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 අගෝස්තු 27 වන දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **මතය**

මගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට වැල්ලවාය ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ මුදල රු.5,300,415 ක් වුවද එය රු.9,800,415 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් රු.4,500,000 කින් ආදායම් වැඩියෙන් ගිණුම් ගත වී තිබුණි.

(ආ) 2006 අප්‍රේල් 10 දින ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය මගින් සභාවට ලබා දී තිබූ අංක 32-1134 දරන ජීප් රථය සභාවට පවරාගෙන තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව හා ලේඛනය අනුව පොදු තැන්පත් ගිණුමේ රු.2,989,430 ක වෙනස සමුච්චිත අරමුදලට ගළපා තිබුණද ප්‍රවර්ථන වර්ෂය තුල ද මෙම වෙනසට හේතු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**

ගිණුම් විෂයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශණ සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු. 226,525 ක් වූ අතර උපයෝගී පොත්පත් වලට අනුව ශේෂය රු.432,011 ක් විය.

1.3.3 **ගෙවිය යුතු ගිණුම්**

(අ) 1988 සිට 2000, 2002 සිට 2008 හා 2010 සිට 2011 යන වර්ෂ 21 සඳහා සභාව විසින් ගෙවිය යුතු විගණන ගාස්තු වල වටිනාකම රු.401,716 ක් විය. ගිණුම් වල විවිධ ණය හිමියන් යටතේ ඒ සඳහා රු. 372,359 ක ප්‍රතිපාදන සලස්වා තිබුණද මේ දක්වා විගණන ගාස්තු නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක් තුළ සභාවේ විවිධ ගොඩනැගිලි හා ස්ථාන සඳහා ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලයට ගෙවිය යුතු රු.2,069,392 ක ජල ගාස්තු නිරවුල් නොකර ශේෂය ඉදිරියට ගෙන එමින් පැවැතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදලේ ශේෂය රු.945,320 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදීත් එම ශේෂය නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 24 දිනැති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව එකතු කළ අගය මත බද්ද අවලංගු කිරිම මත 2012 දෙසැම්බර් 31 දිනට පෙර අය කළ බදු මුදල ගෙවන ලෙසත් දන්වා තිබුණි. එසේ වුවත්, 2005 වර්ෂයේ සිට 2013 මාර්තු දක්වා අයකර ගත් රු.1,816,234 ක් වටිනා එකතු කළ අගය මත බදු මුදල් ගෙවිය යුතු තැන්පතු වශයෙන් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඉ) කුලී නිවාස වල පදිංචි පුද්ගලයින් විසින් 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සභාවේ තැන්පත් කල රු.63,585 ක නිවාස කුලිය අදාළ පාර්ශවයන් හඳුනා ගෙන නිරවුල් කිරිමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඊ) 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අය කළ රු.184,636 ක් වටිනා මුද්දර ගාස්තු මුදල දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

1.3.4 <u>ලැබිය යුතු ගිණුම්</u>

වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින දැනට සේවයේ නොමැති සේවකයින් 60 දෙනෙකුගෙන් අයවිය යුතු රු.142,890 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.190,058,262 ක් වූ වත්කම් විෂයන් 03 ක් හා රු.25,076,972 ක් වූ වගකීම් විෂයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 **<u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **<u>නීති,රීති රෙගුලාසි වලට යොමුව</u>** | **<u>අනුකූල නොවීම</u>** |
|---|---|
| (අ) **<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | |
| (i). 158 හා 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.50,789,622 ක් වූ හිග ආදායම් අයකර ගෙන නොතිබුණි. |
| (ii). 136 වගන්තිය | සභාව සතු කඩ කාමර කුලී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) **<u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>** | |
| 237 | විවිධ කාර්යයන් සිදුකිරීම සඳහා මිලදී ගෙන තිබූ රු.707,294 ක් වූ ද්‍රව්‍ය හා උපකරණ සම්බන්ධයෙන් තොග සහතික ඉදිරිපත් කර නොතිබුණි. |

1.3.7 **<u>අවිධිමත් ගනුදෙනු</u>**

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 2012 ජනවාරි 25 දිනැති අංක 12/ආ/06/අතිරේක ඉන්ධන දරන ලිපිය ප්‍රකාරව සභාවේ කැබ් රථයට වෙන් කරන ලද මාසික ඉන්ධන පරිමාව ලීටර් 312 ක් විය. එම ප්‍රමාණය ඉක්මවා පාවිච්චි කළ ඉන්ධන ලීටර් 200 ක් සඳහා මොනරාගල සහකාර කොමසාරිස්ගේ අනුමැතියද ඊට වඩා වැඩි වන ලීටර් ප්‍රමාණය සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියද ලබා ගත යුතු වුවත්, එසේ අනුමැතිය නොමැතිව රු.256,870 ක් වටිනා ඉන්ධන ලීටර් 2,117.66 ක් සමාලෝචිත වර්ෂයේදි භාවිතා කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කමිටු 17 ක් පවත්වා එක් කමිටුවකට රු.750 බැගින් රු.63,750 ක් ගෙවා තිබූ අතර, දීමනා ලබා ගැනීමේදී ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 2.9.1 ප්‍රකාරව පැමිණීමේ සටහන් පත්‍රිකා ගෙවීම් ලේඛන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 2013 අප්‍රේල් 30 දිනැති අංක 12/ආ/06/01/(වාහන) දරන ලිපියෙන් සභාව සතු අංක 252-6335 දරන කැබ් රථය අළුත්වැඩියා කර ධාවනයට යොදා ගන්නා තෙක් 2013 මැයි 01 දින සිට 14 දක්වා එනම්, සති දෙකක කාලයක් සඳහා අංක UP – MB 4790 දරන ටොයෝටා වෑන් රථය ලබා දී තිබුණි. එසේ වුවද අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ මැයි සිට අගෝස්තු 27 දක්වා වාහනය පාවිච්චි කර ඒ සඳහා ඉන්ධන ලීටර් 2850.3 ක් සඳහා රු.346,026 ක් වැය කර තිබූ අතර, එම කාල පරිච්ඡේදය තුළදීම සභාව සතු අංක 252- 6335 දරන කැබ් රථය වෙනුවෙන් ඉන්ධන ලීටර් 745 ක් සඳහා රු.90,443 ක වියදමක්ද දරා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 05 කදී විවිධ කාර්යයන් සඳහා සභා අරමුදලින් රු.74,150 ක වියදමක් දරා පෞද්ගලික වාහන කුලියට ලබාගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,674,949 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,199,078 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>බදු කුලී</u>

නව සුපිරි වෙළඳ සංකීර්ණයේ මුළු කඩ කාමර 32 න් කඩ කාමර 7ක් සමාලෝචිත වර්ෂය තුළ ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 <u>සිනමා ශාලා බදු</u>

සභාවට අයත් ජේ.එම්. කුමාරදාස සම්මන්ත්‍රණ ශාලාවේ සිනමා දර්ශන පෙන්වීම සඳහා පුද්ගලයකුට 2011 සැප්තැම්බර් 01 දින සිට වසර 05ක කාලයකට බදු දීම සඳහා එකතු කල අගය මත බදු හා මුද්දර ගාස්තු ඇතුළුව රු.65,492 ක ආරක්ෂිත ඇප තැන්පත් ලබාගෙන තිබුණද විගණන දිනය වූ 2014 ජූනි 16 දින වන විටත් සිනමා ශාලාව ආරම්භ කර නොතිබූ අතර ඒ තුලින් සභාවට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

#### 2.2.3 <u>වැල්ලවාය සතිපොල බදු</u>

(අ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති සංග්‍රහයේ අංක 177 හා 178 අනුව 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව වැල්ලවාය සතිපොල පසුගිය වර්ෂයේ බදු දුන් මුදල වන රු.1,920,000 ක මුදලට ටෙන්ඩර් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේද බදු දී තිබුණි

(ආ) වැල්ලවාය සතිපොලෙහි මාසික බදු වාරිකය වන රු.160,000 ක මුදල ඊළඟ මාසයේ 10 දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේදී රු.29,783 ක් ප්‍රමාද දඩ අය කරගෙන නොතිබුණි.

#### 2.2.4 <u>ගව මස් කඩ බදු</u>

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 31 දින පැවැති මාසික සභා රැස්වීමට වැල්ලවාය ගවමස් කඩය බදු ගැනීම සඳහා ප්‍රදේශයේ එක්තරා පදනමක් විසින් රු.1,000,000කට ඉල්ලා තිබූ ලිපියක් සභා ගත කර තිබුණ ද සභාව විසින් මෙම ගවමස් කඩය රු.811,250ක මුදලකට බදු දීමට 2013 ජනවාරි 30 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ අනුව සභාවට රු.188,750ක ආදායමක් අහිමි වී තිබුණි.

2.2.5 **කරදිය මිරිදිය මාළු කඩ බදු**

සමාලෝචිත වර්ෂය සඳහා කරදිය මිරිදිය මාළු කඩය රු.500,000කට එක්තරා බදුකරුවෙකු වෙත බදු දී තිබූ අතර, ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට බදු මුදල් ගෙවා නොතිබීම මත අයවිය යුතු රු.19,041 ක ප්‍රමාද ගාස්තු අය කරගෙන නොතිබුණි.

2.2.6 **වෙනත් ආදායම්**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන සහ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයක් සඳහා ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අධිකාරිය අනුමත කර ඇති සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන හෝටල් 01 ක් සහ ලැගුම්හල් 04 කින් අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් 1% නොඉක්මවන ගාස්තුවක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.7 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 15,505,533 |
| මුද්දර ගාස්තු | 1,442,800 |

2.3 **අධිභාර**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 (3) වගන්තියේ විධි විධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2013 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු.70,338 ක් විය.

2.4 **අවිධිමත් ගනුදෙනු**

සමාලෝචිත වර්ෂය සඳහා බස් නැවතුම්පල පොදු වැසිකිළිය රු.220,000 ක වාර්ෂික බදු මුදලකට බදුකරුවෙකු වෙත බදු දී තිබුණි. ගිවිසුමේ 18 වන වගන්තිය ප්‍රකාරව මාසික විදුලි ගාස්තු බදුකරු විසින් ගෙවිය යුතු වුවත්, 2013 ජනවාරි සිට ජූලි දක්වා විදුලි ගාස්තු වශයෙන් රු.25,860 ක මුදලක් සභාව විසින් ගෙවා තිබුණි.

2.5 **මතභේදයට තුඩු දුන් ගණුදෙනු**

නව සාප්පු සංකීර්ණයේ එළිමහන් විදුලි පහන් වලට අයත් මනු අංක 7301034 ට අදාළ විදුලි පරිභෝජනය වෙනුවෙන් 2013 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා රු.72,867 ක වියදමක් දරා තිබුණි. විගණන දිනය වූ 2013 නොවැම්බර් 12 දින ප:ව 12.45 ට මෙම මනුව පරීක්ෂාවේදී එළිමහන් විදුලි පහන් සියල්ලම නිවා තිබියදීත් මනුව ක්‍රියාත්මක වෙමින් පැවැතුණි. ඒ අනුව මෙම විදුලි සැපයුම වෙනුවෙන් පරිභෝජනය කරන විදුලිය ප්‍රමාණයට වඩා ගෙවීම් කිරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

2.6 **නිෂ්ක්‍රීය වත්කම්**

ජනාධිපති ලේකම්ගේ 2013 ජූනි 05 දිනැති අංක PCMD/PR/2013 දරන ලිපියෙහි විධිවිධාන ප්‍රකාරව සභාව සතු පාවිච්චියට ගත නොහැකි වාහන 03 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.7 **ඝන අපද්‍රව්‍ය කළමණාකරණය**

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මක් සභාව මඟින් සකස් කර ඒ සඳහා වූ ඉඩමට වාර්ෂික විවිධ අවසර පත්‍රයක් වන රක්ෂණ දෙපාර්තමේන්තුවෙන් 2012 ජනවාරි 16 වන දින ලබා දී තිබුණ නමුත් සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කුණු කසල බැහැර කිරීමේදී බැහැර කරන ස්ථානයේ පොලිතීන් වැනි අපද්‍රව්‍ය ප්‍රදේශය පුරා විසිරී යාම නිසා පරිසරයට හානිකර තත්ත්වයක් උදා වී තිබුණි.

2.8 **<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

3. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය